# ධනවාදය, මාක්ස්වාදය හා ජාතික මතවාද

ධනවාදය ලෝ පුරා තම ආධිපත්‍යය පතුරා ඇත. එ පරාජය කළ හැක්කේ කෙසේ ද? එ සඳහා මාක්ස්වාදයට ඇති ඉඩකඩ කවරේ ද? ජාතික මතවාදයකට යම්කිසි දිනෙක ධනවාදය පැරදවිය හැකි ද? අප මෙහි දී මේ ප්‍රශ්න ගැන සුළු විස්තරයක් කරන්නේ, එයට කෙටි පිළිතුරු දීමට අදහස් කරන්නේ, සිංහල බෞද්ධ සංස්කෘතිය මත පදනම් වූ ප්‍රවාද, මතවාද සංකල්ප ආදිය මුල්කර ගනිමිනි. ජාතික මතවාද යනු වත්මන් සංදර්භයෙහි සිංහල බෞද්ධ සංස්කෘතිය මත පදනම් ව ගොඩනංවන ලද ප්‍රවාද (තියරි) නිගමන ආදිය වෙයි.

ධනවාදය යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රතිඵලයකි. ධනවාදය පමණක් නොව බටහිර විද්‍යාව ද නූතනත්වයෙහි ප්‍රතිඵලයකි. පහළොස්වැනි සියවසෙහි ඉතාලියෙහි ඇරඹුණු නූතනත්වය තවමත් විකාශය වෙයි. දහහත්වැනි සියවසේ ඇතිවිණි යැයි කියන ඊනියා ආලෝකනනය යනු නූතනත්වයේ තවත් පියවරක් පමණකි. එ තවදුරටත් විකාශය වනු ඇත. ජනගහනය ලෙස ගත්කල ලෝකය ම කෙසේ වෙතත් ඉන් අඩකට වඩා තම ග්‍රහණයට ගැනීමට යුරෝපීයයන්ට හැකි වී තිබේ. එහෙත් මෙහි අවසානය කුමක් ද? නූතනත්වය අවසන් වනු ඇත්තේ මුළු ලෝකයම කාලකන්නි බවට පත්කර බොහෝ මිනිසුන් නැති වී යැමට සැලැස්වීමෙනි. එහෙත් නූතනත්වය අපට අවශ්‍ය පරිදි නැතිකළ හැක්කේ නැති කම්කරු පංතියක නාමයෙන් ඊනියා විප්ලව කිරීමෙන් නොව එ සඳහා අවශ්‍ය අදහස් රෝපණය කිරීමෙනි, එ මතවාද විසින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විකල්ප සමාජ යුගයක් බිහි කෙරෙනු ඇත.

එ හැරෙන්නට වෙනත් විකල්පයක් නැත. කිසිකබල් මාක්ස්වාදයට හෝ එහි කියැවෙන කම්කරු පංතියට හෝ කිසි දිනෙක ධනවාදයවත් නූතනත්වයවත් පරාජය කිරීමට නො හැකි ය. එයට ප්‍රධාන හේතුව මාක්ස්වාදය යල් පැන ගිය දහමක් වීම නො වේ. යමක් යල් පැනිය හැක්කේ එය යම්කිසි දිනෙක වලංගු වී පැවතියේ නම් ය. මාක්ස්වාදය කිසිම දිනෙක වලංගු වූ මතවාදයක් නො වේ. බෙහෙතකටවත් සොයා ගැනීමට නොහැකි කම්කරු පංතියක් (පිටතින් ගෙනෙන පංති විඥානයක් ඇතැයි කියන කම්කරු පංතිය හා කම්කරු පංති විඥානය නිරවුල්ව සූත්‍රගත කිරීමට මාක්ස්වාදයට නොහැකි වී ඇත. වැඩි විස්තර මාක්ස්වාදයේ දරිද්‍රතාව කෘතියෙහි සඳහන් වෙයි) ගැන කියන මාක්ස්වාදයට ධනවාදය පරාජය කළ හැක්කේ කෙසේ ද? මාක්ස්වාදීන්ට කළ හැක්කේ ධනවාදයට විරුද්ධ ව අදෝනා කීම පමණකි. නැති කම්කරු පංති නායකත්වයක් ගැන කියමින් ධනවාදය නැතිකිරීම සඳහා පොල් ගැසීම පමණකි.

එහෙත් මාක්ස්වාදයෙහි සාධනීය ලක්ෂණ එකක් දෙකක් නොමැතිවා නො වෙයි. එහි සාධනීය ලක්ෂණය ඇත්තේ එහි න්‍යායෙහි (ලොජික්) ය. මාක්ස්වාදය මෙන් ම හෙගල්වාදය ද ත්‍රිකෝටික න්‍යාය මත පදනම් වෙයි. එ ඇරිස්ටෝටලීය ද්විකෝටික න්‍යායට විරුද්ධ ය. ඊනියා අපෝහකය යනු අන්කිසිවක් නොව ත්‍රිකෝටික න්‍යාය යොදාගැනීමට කරන ලද තැතක ප්‍රතිඵලයකි. එහෙත් බටහිර යුදෙව් සංස්කෘතිය විසින් බිහිකරනු ලැබූ හෙගල්ට හා මාක්ස්ට ත්‍රිකෝටික න්‍යාය සූත්‍රගත කිරීමට නො හැකි විය. ඔවුහු ද්විකෝටික න්‍යායෙහි කොටු වූහ. අපෝහකයේ රූපිකය නම් කෘතියෙහි මෙය විස්තර කෙරෙයි. එහෙත් මාක්ස් හෙගල් න්‍යායෙහි අපට අවශෝෂණය කරගත හැකි තරම් දෙයක් නොමැත්තේ අප සංස්කෘතියෙහි චතුස්කෝටික න්‍යාය එයට වඩා බොහෝ වර්ධනය වී ඇති හෙයිනි.

මා බොහෝ කලක් පිළිගෙන සිටියේ මාක්ස්වාදය යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි බිහිවුවක් ලෙස ය.එහෙත් ටික කලකට පෙර එය කතෝලික චින්තනය මත පදනම් වී ඇති බව මට වැටහිණි. මාක්ස්වාදය පමණක් නොව ෆැසිස්ට්වාදය ද පදනම් වී ඇත්තේ කතෝලික චින්තනය මත ය. සාමූහිකත්වය සංස්ලේෂණය ආදිය කතෝලික චින්තනයට අයත්වෙයි. එහෙත් මාක්ස්වාදයට ද ෆැසිස්ට්වාදයට ද පොදු වූ දුර්වලකමක් විය. එ දෙකම නූතනත්වයට විරුද්ධ නො වී ය. මාක්ස්වාදයට ද ෆැසිස්ට්වාදයට ද අවශ්‍ය වුයේ මාර්ග දෙකක යමින් වුව ද නූතනත්වය තව දුරටත් වර්ධනය කිරීම ය. නූතනත්වය වර්ධනය කරමින් ධනවාදයට විරුද්ධ විය නොහැකි බව මාක්ස්වාදීහු තේරුම් නොගත්හ. අනෙක් අතට ධනවාදය කතෝලික චින්තනයට හරස්වන බව ෆැසිස්ට්වාදය තේරුම් නො ගත්තේ ය. කතෝලික චින්තනය මත පදනම් වෙමින් ධනවාදය ඉදිරියට ගෙන යා නොහැකි බව ෆැසිස්ට්වාදය නොදැන සිටියේ ය. ෆැසිස්ට්වාදය යනු ධනවාදය ධනවාදී නොවන ආකාරයකට පවත්වාගෙන යැමට කරන ලද උත්සාහයක් ලෙස අපට ද කිව හැක්කේ ෆැසිස්ට්වාදයෙහි දක්නට ලැබෙන මේ නෛසර්ගික විසංවාදය හේතුකොටගෙන ය. මාක්ස්වාදයට පහර

© Prof. Nalin De Silva

ගැසීම යනු ධනවාදය ආරක්‍ෂාකිරීමක් නො වේ. ඒ එසේ යැයි කිව හැක්කේ ඇරිස්ටෝටලීය න්‍යාය අනුගමනය කරමින් මාක්ස්වාදය ධනවාදයට විරුද්ධ වෙයි, එබැවින් මාක්ස්වාදයට පහර ගැසීම යනු ධනවාදය ආරක්‍ෂාකිරීමක් යැයි තරක කරන පුහු උගතුන්ට පමණකි. ක්‍රිස්තියානි නූතනත්වයට ද එහි අංගයක් වූ ධනවාදයට ද විරුද්ධ වීමේ දී අනිවාර්යයෙන් ම මාක්ස්වාදයට පහරගැසීමට සිදුවෙයි. ඒ මාක්ස්වාදය ද නූතනත්වයේ සිරකරුවකු වන බැවිනි.

ධනවාදය පරාජය කිරීම යනු නූතනත්වය රැකගනිමින් කළ හැක්කක් නො වේ. නූතනත්වය රැකගනිමින් ධනවාදය පරාජය කිරීමට යෑමෙන් අවසානයේ දී සිදුවන්නේ නූතනත්වයෙහි ම කිඳා බැසීම පමණකි. මාක්ස්වාදීන් කුමක් කිරීමට උත්සාහ කළ ද ඔවුන්ට නූතනත්වයෙහි සිරකරුවන් වීම හැරෙන්නට කළ හැකි අන් කිසිවක් නැත. මාක්ස්වාදීන් ලෙස අද ලංකාවේ පෙනී සිටින්නන් අවසානයේ දී ක්‍රියා කරන්නේ ධනවාදීන්ට බැල මෙහෙවරකම් කරන්නන් ලෙස ය. දෙමළ ජාතිවාදය පිළිබඳව බොහෝ මාක්ස්වාදීන් ක්‍රියාකර ඇත්තේ බටහිරයන්ගේ මත ප්‍රචාරය කරන ව්‍යාජ උගතුන් ලෙස ය. බොහෝ මාක්ස්වාදීන් දෙමළ ජාතිවාදය ආරක්‍ෂා කරමින් සිංහල බෞද්ධ සංස්කෘතියට එරෙහිව ක්‍රියාකිරීම පුදුමයක් නො වෙයි.

අද නූතනත්වයට එරෙහිව ප්‍රබල මතවාද ගොඩනැගිය හැක්කේ සිංහල බෞද්ධ චින්තනය මත පදනම් ව සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතියෙහි ය. එවැනි මතවාද නිර්මාණය කිරීමට අවශ්‍ය සියලු බීජ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි වෙයි. එහෙත් එපමණකින් අප රටේ වසන සියලු ම බෞද්ධයන් නූතනත්වයටවත් එහි අංගයක් වූ ධනවාදයටවත් විරුද්ධ යැයි නොසිතිය යුතු ය. අප රටේ නගරාශ්‍රිත ව ජීවත්වන බෞද්ධයන්ගෙන් ඉතා වැඩි දෙනා ඕල්කට් බෞද්ධයෝ වෙති. මොවුන්ගෙන් අතිමහත් බහුතරයට තමන් කුඩා කල සිට හැදුණු වැඩුණු සිංහල බෞද්ධ සංස්කෘතියෙන් කැඩීමක් නැත. එහෙත් ඔවුහු හැකිතාක් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අනුකරණය කරමින් ඒ පසුපස යති. මෑතක් වන තුරුම ඔවුන්හෙන් බොහෝ දෙනෙක් තමන් සිංහලයන් බෞද්ධයන් වශයෙන් හඳුන්වාදීමට අකමැති වූහ. ඔවුහු ඊනියා ජාත්‍යන්තර බෞද්ධයෝ වූහ.

බුද්ධදහම බටහිර විද්‍යාව සමඟ ගැළැප්පීමට ඔවුහු මහන්සි ගත්හ. කාලාම සූත්‍රය ඊනියා විද්‍යාත්මක විධික්‍රමයක් දැක්වෙන්නක් ලෙස ඔවුන් ප්‍රකාශ කෙළේ එහි අඩක් පමණක් කියවීමෙනි. කාලාම සූත්‍රයෙහි අවසන් භාගයෙහි බුදුන් වහන්සේ සමාජයේ විඤ්ඤූන් අනුගමනය කරන ලෙස දේශනා කළහ. උන්වහන්සේ තම තමන් සියල්ල සොයාගන්නා ලෙස කාලාමයනට අවවාද නො කළහ. පෘථග්ජන කිසිවකුටවත් එසේ කළ නොහැකි බව උන්වහන්සේ දැන සිටියහ. ඊනියා ජාත්‍යන්තර බෞද්ධයන් වූ ඕල්කට් බෞද්ධයෝ කාලාම සූත්‍රයෙහි අඩක් කියවා එහි නොකියවූ අනෙක් අඩ නිරායාසයෙන් අනුගමනය කළහ. බටහිර දැනුම් ආධිපත්‍යයට යටවූ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි නිවට දාසයන් වූ ද ඔවුන්ගේ විඤ්ඤූන් වූයේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය විසින් බිහිකරන ලද බටහිර උගතුන් ය. බුදුන් වහන්සේ දේශනාකර ඇත්තේ ද තමන්ගේ විඤ්ඤූන් කියා ඇති දෙය ම යැයි ප්‍රකාශ කරමින් ඕල්කට් බෞද්ධයෝ ස්වයං මෝහනයකට පත්වූහ.

මොවුහු බොහෝ විට එ ජා පාක්ෂිකයෝ හෝ ඒ පක්‍ෂයෙහි අනුගාමිකයෝ වූහ. කිහිප දෙනෙක් මාක්ස්වාදීහු වූහ. පසුව සඳහන් කරනු ලැබුවෝ කසිකබල් මාක්ස්වාදී සමාජවාදය හා බුද්ධදහම සැසඳීමට උත්සාහ කළහ. එහෙත් දෙමළ ත්‍රස්තවාදය උග්‍රවත් ම ඔවුන්ට ජාතික මතවාදවල පිහිට සෙවීමට සිදුවිය. ඔවුහු ඒ වෙනුවෙන් දේශපාලන පක්‍ෂයක් ද පිහිටුවා ගත්හ. එහෙත් පසුව මේ ඕල්කට් බෞද්ධයන්ගෙන් ඇතැම් පිරිසක් නැවතත් තම පැරණි පක්‍ෂයවූ එ ජා පක්‍ෂයට ආපසු ගියහ. අද දෙමළ ජාතිවාදය පරාජය වී නැතිවුවත් එහි එක් කොටසක් වූ ත්‍රස්තවාදය පරාජයේ එළිපත්තට පැමිණ ඇත. ඒ පරාජයත් සමග නැවතත් දේශපාලන පක්‍ෂවල සංයුතිය වෙනස්වනු ඇත. මහින්ද රාජපක්‍ෂ මහතා බලයට පත්වීමත් සමග ජාතික මතවාද ව්‍යාජ ලෙස පිළිගත් පක්‍ෂවලට තිබූ ඉල්ලුම නැති වී යෑමට පටන් ගත්තේ ය. ත්‍රස්තවාදය පැරදීමත් සමග ඒ පක්‍ෂවලට ඕල්කට් බෞද්ධයන් අතර ඇති ඉල්ලුම තව තවත් අඩුවනු ඇත. එහෙත් දෙමළ ජාතිවාදය පැරදවීමේ කාර්යය තවමත් ඉතිරි වී ඇත. ඒ සඳහා ජාතික මතවාද සකස් කෙරී ඇත. එහි ප්‍රධාන ම කොටසක් වනුයේ සිංහල බෞද්ධ සංස්කෘතිය මෙරට ප්‍රධාන සංස්කෘතිය බව පළමුව සිංහලයන් පිළිගැනීම ය. එහෙත් සිංහලයන් ඒ සඳහා සූදානම් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva